# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1804/13 - 2013 අප්‍රේල් මස 02 වැනි අඟහරුවාදා - 2013.04.02

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 (2) වන උපවගන්තිය යටතේ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මම, මුදල් හා ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයාද විමසා මෙම නිවේදනය මගින් -

(1) ඇමෙරිකානු ඩොලර් මිලියන දෙසිය විස්සක (ඇ.ඩො. 220 මිලියන) මුලු ආයෝජනයකින් යුත් හම්බන්තොට වරායේ, නිදහස් වරාය (Free Port) තුල පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර, පිරිපහදු නොකරන ලද සීනි ආනයනය කර ඒවා එම පිරිපහදු මධ්‍යස්ථානය තුල ප්‍රසාදනය කර එම නිෂ්පාදන මෙරට වෙළඳපොල තුල අලෙවි කිරීම සහ අපනයනය කිරීම සඳහා වූ මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලබන බවත්, මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙන අතර, තවදුරටත් මෙම ව්‍යාපෘතිය මගින් ජාතික අවශ්‍යතාවයෙන් 75% ක් පමණ සීනි ප්‍රමාණයක් මූලිකව සැපයීමට බලාපොරොත්තු වන බවත්, පසුව එම ප්‍රවනතාවය එළඹෙන අවුරුදු දෙකක (02) කාලය තුල සම්පූර්ණයෙන් ජාතික අවශ්‍යතාවය සැපයීමට හැකි වන පරිදි ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා සිටින අතර, ලංකා සුගර් රිෆ්නරි කොම්පැනි (පුද්ගලික) සමාගම ("ව්‍යාපෘති සමාගම") සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර වර්ෂ 2013 ක්වූ පෙබරවාරි මස 07 වන දින මේ සඳහා ව්‍යාපෘති ගිවිසුමකට එළඹෙන ලද බවත් නිවේදනය කරමි ;

(2) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ලංකා සුගර් රිෆ්නරි කොම්පැනි (පුද්ගලික) සමාගම, ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දිනය වන වර්ෂ 2013 ක්වූ පෙබරවාරි මස 07 වන දින සිට ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, එකී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ඉහත කී ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දින සිට අවුරුදු හතක (07) කාලයක් තුල සිදුකළ යුතු බවත් ප්‍රකාශ කර සිටිමි ;

(3) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව මෙහි උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම සමාගමට අදාල වන බවටද නිශ්චිතව දක්වනු ලබමි.

**උපලේඛනය**

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

* බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන මුල් වසරේ ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙක (02) කට පසු, කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර දහය (10) කට ආදායම් බදු පනත යටතේ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංස්ථාපිත ආදායම් බදු නිදහස් කාල පරිච්ඡේදයක්, ඉන්මතු, පැහැදිලි කිරීමක් වශයෙන් ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර දහය (10) ඉකුත් වීමෙන් පසුව එවකට බලපවතින සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාල වනු ඇත.

* ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය සඳහා ගෙවන පොලිය සහ ව්‍යාපෘතිය මගින් සේවයේ යොදවනු ලබන උපදේශකයින්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගම නිදහස් කරනු ලැබේ.

* එකී වසර දහය (10)ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01)කට ලාභවලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශවලට ආදායම් බදු නිදහස ලැබේ.

* ව්‍යාපෘති සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග ඇති කර ගන්නා ලද ගිවිසුමට අනුව ව්‍යාපෘති සමාගමේ උපරිම ප්‍රවාසික සේවකයින් සංඛ්‍යාව පනහ (50) කට උපයන විට ගෙවිය යුතු බදු නිදහස අදාල වනු ඇත.

(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතියට අදාල ප්‍රාග්ධන සහ ඉදිකිරීම් භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාල දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සඳහා සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ.

(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන සහ ඉදිකිරීම් භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සඳහා වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් මත බදු ගෙවීමෙන් නිදහස් වේ.

(ඈ) 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීම් අයකිරීමේ පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන සහ ඉදිකිරීම් භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාල දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සඳහා ජාතිය ගොඩනැගීමේ අයකිරීම් මත බදු ගෙවීමෙන් නිදහස් වේ.

(ඉ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත

- සෘණ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැර ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් වලට අන්‍ය වශයෙන් ආනයනය කරනු ලබන අයිතම් සම්බන්ධයෙන්, ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම මගින් ආනයනය කරන සියලු ප්‍රාග්ධන භාණ්ඩ සහ ගොඩනැගීම් කටයුතු වලට අදාල භාණ්ඩ ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය තුල රේගු බදු අයකිරීම් වලින් නිදහස් කිරීම් අදාල වේ. කෙසේ වෙතත් දේශීය වෙළඳපොලේ එවැනි භාණ්ඩ ප්‍රමාණය සහ ප්‍රමිතියන් නොලැබෙන විට සෘණ ලැයිස්තුවේ සඳහන් අයිතම් සැලකිල්ලට ගනු ලැබේ.

- ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතියට අදාල ප්‍රාග්ධන භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දේශීය වශයෙන් මිලදී ගැනීම් සහ ආනයනය කිරීම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සතෝෂ්ක්ෂණයට සහ අනුමැතියට යටත්ව රේගු බදු අයකිරීම් වලින් නිදහස් කිරීම අදාල වේ. මෙම නිදහස් කිරීම් ව්‍යාපෘතියේ පුද්ගලයෙකු හෝ පුද්ගලික දේපල සම්බන්ධයෙන් ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් අදාල නොවේ.

(ඊ) විනිමය පාලන පනත සහ රෙගුලාසි

විනිමය පාලන පනතේ I, IA, II, III, IV, V සහ VI දරන ප්‍රතිපාදන ව්‍යාපෘති සමාගමට අදාල නොවේ.

(උ) 1969 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතියේ ඉදිකිරීම්වලට අදාල සියලුම ප්‍රාග්ධන හා ඉදිකිරීම් භාණ්ඩ ආනයනය කිරීම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතියට යටත්ව රේගු බදු අයකිරීම්වලින් නිදහස් වන අතර සංශෝධිත 1969 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ ආනයන සීමාකීරීම් වලින් ද ව්‍යාපෘති ඉදිකිරීම් කාලය තුල නිදහස් වේ.

(ඌ) ව්‍යාපෘතියට අදාල අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ආනයනය කරන අවස්ථාවේ දී ව්‍යාපෘති සමාගමට අදාල නොවේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා.ම.,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 27 වන දින
ආයෝජන හා ප්‍රවර්ධන අමාත්‍යාංශය,
කොළඹ දී ය.

04 - 446

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.